PAFFREL
නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.
சுதந்திரமானதும் நீதியானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.
PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS

2015.09.07

ගරු කරු ජයසූරිය මැතිතුමා,

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක,

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව.

ගරු කරු ජයසූරිය මැතිතුමනි,

**8 වන පාර්ලිමේන්තුවේ නව කථානායක ධූරයට පත්වූ ඔබට අපගේ සුභ පැතුම්**

ශ්‍රී ලංකාවේ 8 වන පාර්ලිමේන්තුවේ ගරු කථානායකවරයා ලෙස තේරී පත්වූ ඔබතුමන්ට පැෆ්රල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂකවරයා ප්‍රමුඛ අධ්‍යක්ෂක මණ්ඩලයේත්, කාර්ය මණ්ඩලයේත් සුභ පැතුම් මේ සමග යොමු කරමු.

ලාංකික දේශපාලන සංස්කෘතියේ සාධනීය වෙනසක සුභ ලකුණු පහලවෙමින් තිබෙන මොහොතක ජනතා පරමාධිපත්‍යයේ උත්තරීතරම ආයතනය වන ව්‍යවස්ථාදායකයේ ප්‍රධානියා ලෙස අත්දැකීමෙන් පිරිපුන්, සදාචාරවත් නායකයෙකු පත්වීම පිළිබඳව අප බෙහෙවින් සතුටට පත් වුනෙමු.

ඉදිරි වසර පහක කාලය තුළ ලංකා පාර්ලිමේන්තුවේ පැහැදිලි වෙනසක් අප ඔබගේ නායකත්වය යටතේ අපේක්ෂා කරන අතර විශේෂයෙන්ම පහත සඳහන් කරුණු කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරනු කැමැත්තෙමු.

1. ව්‍යවස්ථාදායකයේ ප්‍රමුඛ කාර්ය වන නීති, ප්‍රතිපත්ති සම්පාදන, මූල්‍ය පාලනය වැනි කරුණු කෙරෙහි ජනතා නියෝජිතයන්ගේ අවධානය යොමු කරවීම සහ ඒ සඳහා අවශ්‍ය වන්නාවූ පුහුණුව, දැනුම ඔවුනට ලබාදීම.

2. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විවිධ විෂය ක්ෂේත්‍ර සම්බන්ධ අවශ්‍ය දැනුම ලබා ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම හා පුස්තකාල පරිශීලනයට යොමු කිරීම

3. පාර්ලිමේන්තුවේ පර්යේෂණ අංශය පුළුල් කිරීම,

4. පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලාගේ පැමිණීම සහ සක්‍රියව සහභාගීත්වය ප්‍රශස්ත මට්ටමක පවත්වාගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් විශේෂයෙන්ම පාර්ලිමේන්තුව ඵලදායී සාකච්ඡා හා සංවාද පවත්වන ස්ථානයක් බවට පත්කිරීම සහ පාර්ලිමේන්තුව ජනතාවට ආදර්ශයක් සපයන ස්ථානයක් බවට පත් කිරීම

# 12/3, Robert Terrace, Robert Gunawardana Mawatha, Colombo 06, Sri Lanka.
Tel : (+94) 11 2514441 / 11 2514442 Fax : (+94) 11 2514443
E-mail : paffrel@sltnet.lk Website : www.paffrel.lk

5. පාර්ලිමේන්තු න්‍යාය පත්‍රය ජනතාවට දැනගැනිම සඳහා කල් ඇතිව ප්‍රසිද්ධ කිරීම සහ ඒ ඒ විෂයයන් පිළිබඳව උනන්දුවක් සහිත ජනතාවට මහජන ගැලරියට සහභාගි වීම සඳහා ඉඩ ප්‍රස්ථාව පුළුල් කිරීම.

6. පාර්ලිමේන්තු සංවාද රූපවාහිනී මාධ්‍ය හරහා ප්‍රචාරය කිරීම.

7. තමන්ගේ මහජන නියෝජිතයන් පිළිබඳව දැනගැනිමට ජනතාවට අයිතියක් ඇති බැවින් තේරී පත් වන මන්ත්‍රීවරු 225 දෙනාම පිළිබඳව පොදු ජීව දත්ත පත්‍රිකාවක් හරහා ජනතාවට ඔවුන් පිළිබඳ තොරතුරු දැන ගැනිමට සැලස්වීම. (ඒ සඳහා පාර්ලිමේන්තු වෙබ් අඩවිය භාවිත කළ හැක)

මෙම කරුණු සම්බන්ධව ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරනු ඇතැයි අප දැඩිසේ විශ්වාස කරමු.

ස්තුතියි.

මෙයට විශ්වාසී,

රෝහණ හෙට්ටිආරච්චි,

විධායක අධ්‍යක්ෂ.